C

**නිවේදනය**

"ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)" නමැති පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින් 2016 පෙබරවාරි මස 10 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ(5)(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව සෑම පළාත් සභාවකටම යොමු කර ඇති අතර, ඒ ඒ පළාත් සභාවේ අදහස් පාර්ලිමේන්තුවට එවන ලෙස ස්ථාවර නියෝග අංක 46අ(2)(අ) යටතේ ඉල්ලා සිටින ලදී.

නැගෙනහිර, බස්නාහිර, දකුණු, සබරගමුව, මධ්‍යම, උතුරු මැද සහ ඌව යන පළාත් සභා මෙම පනත් කෙටුම්පතට එකඟත්වය පළ කර ඇත.

වයඹ සහ උතුරු පළාත් සභා සංශෝධනවලට යටත්ව මෙම පනත් කෙටුම්පත සම්මත කිරීමට එකඟ වී ඇත.

පළාත් සභාවල අදහස් ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු යැයි නියෝග කරමි.